**ශීර්ෂය 207 පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව**

**-------------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**----------------**

1.1 **තත්ත්වාගණනය කළ මතය**

**------------------------------**

පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුලත් සම්පින්ඩණ වාර්තාව 2021 අගෝස්තු 09 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදි. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුට අදාල වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2021 අගෝස්තු 18 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2. තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

**--------------------------------------------**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3. **මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

**----------------------------------------------------------------------------------------------------**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4. මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

---------------------------------------------------------------

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදිම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශිලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මා විසින් කර තිබුණු පහත සඳහන් නිර්දේශය ක්‍රියාත්මක කර නොතිබුණි.

| ඡේද යොමුව | විගණන නිරීක්ෂණ | නිර්දේශය |
| --- | --- | --- |
| 1.6.1 (ආ) | රු.මිලියන 911.5 ක් වන ප්‍රධාන කාර්යාලය පිහිටි ඉඩම සහ රු.මිලියන 138 ක් වන ගොඩනැගිල්ලෙහි අයිතිය දෙපාර්තමේන්තුව වෙත පවරා ගැනීමට කටයුතු කරන ලෙස පසුගිය විගණන වාර්තා මගින් පෙන්වා දී තිබුණද සමාලෝචිත වර්ෂයේදීද මේ පිළිබඳව ප්‍රමාණවත් අවධානයක් යොමුකර නොතිබුණි. | දේපළ වල අයිතිය දෙපාර්තමේන්තුවට පවරා ගැනීමට කටයුතු කළ යුතු වීම. |

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 ගිණුම් ඉදිරිපත් කිරීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| දෙපාර්තමේන්තුවට අයත් ප්‍රවේණිගත වත්කම් ලෙස, පෞරාණික ගොඩනැගිලි හා ස්මාරක, පුරාවිද්‍යාත්මක ස්ථාන, සංරක්ෂිත ප්‍රදේශ, ස්වාභාවික සම්පත් සහ කලාකෘතීන් අයත් වේ. මිල කළ නොහැකි වටිනාකමක් ඇති මෙම වත්කම් පිළිබඳව පිළිගත් ගණකාධිකරණ මූලධර්මයන්ට සහ ගිණුම් ප්‍රතිපත්තියකට අනුව මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කිරීමටත්, වර්ෂ ගණනාවක සිට භෞතික සමීක්ෂණයක් සිදු කිරීමටත් පියවරගෙන නොතිබුණි. | පුරාවස්තු වල අගය මිල කළ නොහැකි නිසා ස්මාරක සහ අනෙකුත් ප්‍රවේණිගත වත්කම් වල වටිනාකම මූල්‍ය ප්‍රකාශන වල සටහන් කිරීමට නොහැකි වී ඇත. | මූල්‍ය නොවන වත්කම් පොත්වල සටහන් කිරීමටත් ඒ පිළිබඳව තොරතුරු මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කිරීමට ක්‍රියා කළ යුතු වීම. |

1.6.2 **මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය**

-----------------------------------

| **විගණන නිරීක්ෂණය** | | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| (අ) | මූල්‍ය ප්‍රකාශන අනුව ගෘහ භාණ්ඩ හා කාර්යාලීය උපකරණ, මූලධන වත්කම් අත්පත් කර ගැනීම සඳහා මුළු වියදම් එකතුව රු.717,270 ක් වුවද, මූල්‍ය නොවන වත්කම් සංචලනය පිළිබඳ වාර්තාවේ එම වටිනාකම රු.1,436,837 ක් ලෙස රු.719,567 ක් වැඩියෙන්ද, එම වාර්තාවේම රු.2,108,516 ක් වූ යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ සඳහා වන එකතු වටිනාකම රු.1,388,949 ක් ලෙස රු.719,567 ක් අඩුවෙන්ද සටහන් කර තිබුණි. | යන්ත්‍රෝපකරණ ලෙස මිලදීගත් රු.709,568 ක මුදලක් කාර්යාල උපකරණ ලෙස සටහන් වීම නිසා මෙම වෙනස ඇතිවිය. භාණ්ඩාගාරය සමඟ සාකච්ඡා කර නිවැරදි කරමි. | පිළිතුර ප්‍රකාරව නිවැරදි කළ යුතු වීම. |
| (ආ) | වෙනත් මූලධන වියදම් යටතේ විවිධ පාර්ශව වලින් ලැබී ගවේෂණ, කැණීම් සහ සංරක්ෂණ ව්‍යාපෘති සඳහා දරන ලද එකතුව රු.80,664,737 ක් මූල්‍ය නොවන වත්කම් සංචලනය පිළිබඳ වාර්තාවේ ඇතුළත් කර නොතිබුණි. | කැණීම් මඟින් අතැම් අවස්ථා වලදී පුරාවස්තු සොයා ගනු ලැබුවද, පුරාවස්තුවල මිල කළ නොහැකි වස්තූන් සේ සැලකේ. ඒ අනුව ඒවා මූල්‍ය නොවන වස්තූන් ලෙස සටහන් තබා නොමැත. | විවිධ පාර්ශව වලින් විවිධ ව්‍යාපෘති සඳහා ලැබීම් මූල්‍ය නොවන වත්කම් සංචලන වාර්තාවේද සටහන් කළ යුතු වීම. |

1.6.3 **රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම**

-------------------------------------------

| **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුමේ සමාලෝචිත වර්ෂය අවසානයට කේවල ශේෂ වර්ගීකරණ සාරාංශයේ එකතුව රු.96,377,512 ක් වුවද, පාලන ගිණුමේ ශේෂය රු.96,989,808 ක් වූයෙන් රු.612,296 ක් වූ වෙනස වර්ෂ 05 කට වැඩි කාලයක සිට සැසඳුම් කර නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | 2020 දෙසැම්බර් 31 දිනට වෙනස රු.612,265.85 කි. මෙම වෙනස පරීක්ෂා කර නිරවුල් කිරීමට කටයුතු කරමි. | පිළිතුර ප්‍රකාරව මෙම වෙනස පරීක්ෂා කර නිරවුල් කළ යුතුවීම. |

1.6.4 **තැන්පතු ශේෂයන්**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2020 දෙසැම්බර් 31 දිනට තැන්පත් ගිණුම් පිළිබඳ ප්‍රකාශයේ අංක 6000-0-0-13-0-119 දරන තැන්පත් ගිණුමේ දෙපාර්තමේන්තු පොත් අනුව ශේෂය, එදිනට භාණ්ඩාගාර පොත් අනුව ශේෂයට වඩා රු.35,000 ක් වැඩියෙන් සටහන් කර තිබූ අතර, එදිනට අංක 6000-0-0-13-0-153 දරන තැන්පත් ගිණුමේ දෙපාර්තමේන්තු පොත් අනුව ශේෂය එදිනට භාණ්ඩාගාර පොත් අනුව ශේෂයට වඩා රු.35,000 ක් අඩුවෙන් සටහන් කර තිබුණි. මෙම වෙනස හඳුනාගෙන නිවැරදි කර නොතිබුණි. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. | මෙම පොදු තැන්පතු ගිණුම් ශේෂ නිවැරදි කිරීමට ක්‍රියා කළ යුතු වේ. |

**1.6.5 අග්‍රිම ශේෂය**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2020 නොවැම්බර් 30 දිනැති අංක 06/2020 දරන භාණ්ඩාගාර මෙහෙයුම් මාර්ගෝපදේශය අනුව, 2020 දෙසැම්බර් 31 දිනට අක් මුදල් ගිණුම පියවා මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාරය වෙත ප්‍රේෂණය කළ යුතු වුවත්, එදිනට එකතුව රු.6,404,075 ක් වූ මුදල් පොතේ ශේෂය 2021 ජනවාරි 18 දින දක්වා දින ප්‍රමාදයකින් පසුව ප්‍රේෂණය කර තිබුණි. | තැන්පත් ගිණුමට අනපේක්ෂිත ලෙස දෙසැම්බර් මස ලැබුණු මුදල් වියදම් නොවීම මත මෙම මුදල් ඉතිරිවී ඇත. | චක්‍රලේඛය අනුව අග්‍රිමය පියවීමට ක්‍රියා කළ යුතු වේ. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 වියදම් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ මූලධන වියදම් වැය විෂයයන් 18 ක් සඳහා මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.154,246,000 ක් වූ අතර, මුළු තත්‍ය වියදම රු.88,888,190 ක් වූයෙන්, මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.65,357,810 ක ඉතිරියක් විය. එය මුළු ප්‍රතිපාදනයෙන් සියයට 42 ක් වීම හේතුවෙන් ප්‍රාග්ධන වැය සඳහා ලබාදී තිබූ ප්‍රතිපාදන ඵලදායී ලෙස උපයෝජනය කර නොතිබුණි. | 2020 වර්ෂය තුළ කොරෝනා රෝගය දීප ව්‍යාප්තව පැවතීම මත දෙපාර්තමේන්තුවේ ප්‍රාදේශීය වශයෙන් ක්‍රියාත්මක කරන ව්‍යාපෘති සඳහා සේවකයින් ප්‍රාදේශීයව යැවීමට (සංචරණ සීමා නිසා) අපහසුවීම මත ව්‍යාපෘති රාශියක් අපේක්ෂිත පරිදි ඉටු කිරීමට නොහැකි විය. | ප්‍රාග්ධන වැය සඳහා ලබාදී ඇති ප්‍රතිපාදන එම මුදල් වෙන් කළ කාර්යයන් සඳහා භාවිතා කර අපේක්ෂිත ඉලක්ක ලඟා කර ගැනීමට කටයුතු කළ යුතුවීම. |

**2.2 බැරකම් හා බැදීම්වලට එළඹීම**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| පුනරාවර්ථන වැය විෂයයන් 08 කට අදාළව එම වැය විෂයයන් වල අයවැය ප්‍රතිපාදන වල ඉතිරිවීම් ඉක්මවා එකතුව රු.2,762,182 ක් බැරකම් වලට එළඹී තිබුණි. | දෙපාර්තමේන්තු වාහන ඉතා පැරණි වීමත්, වාර්ෂිකව ඉල්ලුම් කළ ප්‍රතිපාදන නොලැබීමත් මත මෙසේ ප්‍රධාන වශයෙන් බැරකම් වැඩි වී ඇත. | ඇස්තමේන්තුගත ප්‍රතිපාදන සීමාව තුළ බැරකම් වලට එළඹීමට ක්‍රියා කල යුතු වීම. |

## 2.3 වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2018 වර්ෂයේ සිටම නිවාස ඉදිකිරීම් හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය මඟින් අනුමැතිය ගෙන අනුමත කරන ලද ඇස්තමේන්තු අනුව ව්‍යාපෘති කටයුතු ඉටුකර වියදම් වවුචර් මධ්‍යම සංස්කෘතික අරමුදල වෙත ඉදිරිපත් කර මුදල් ප්‍රතිපූරණය කරගෙන තිබුණි. එසේ වුවද 2019 සහ 2020 වර්ෂ වලදී වැය කර තිබුණු එකතුව රු.38,064,351 ක් මුදල් ප්‍රතිපූර්ණය කරන ලෙස මධ්‍යම සංස්කෘතික අරමුදල මඟින් ඉල්ලීම් කර තිබුණද, එම මුදල් ප්‍රතිපූර්ණය කර නොතිබුණි. | 2019 දෙසැම්බර් 04 දින සිට 2020 දෙසැම්බර් 17 දක්වා ඉල්ලා සිටි මුදල් මේ වන තෙක් ලැබී නොමැත. එහි වටිනාකම රු.38,664,351 කි. මධ්‍යම සංස්කෘතික අරමුදලට ලැබෙන ආදායම් අහිමි වීම මත බිල්පත් පියවීම සඳහා මුදල් නිදහස් කිරීම ප්‍රමාද වී ඇත. | මෙම ව්‍යාපෘති මඟින් සැලසුම් කළ කාර්යය අඛණ්ඩව කරගෙන යාම සඳහා අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන රැස් කරගත යුතු වීම. |
| (ආ) | පාහියංගල ලෙන ව්‍යාපෘතිය සඳහා 2017 මැයි 02 දින එකතුව රු.5,002,431 ක මුදලක් මධ්‍යම සංස්කෘතික අරමුදල මඟින් වෙන් කරගෙන තිබුණි. එම මුදල් වෙන් කළ කාර්යය සඳහා භාවිතා නොකර, 2020 ඔක්තෝබර් 09 දින ජර්නල් සටහනක් භාවිතා කර මධ්‍යම සංස්කෘතික අරමුදල් දායකත්වය යටතේ අරඹන ලද වෙනත් ව්‍යාපෘතිවල ද්‍රව්‍ය සැපයුම්කරුවන්ට ගෙවීම සඳහා භාවිතා කර තිබුණි. | මධ්‍යම සංස්කෘතික අරමුදල මඟින් ලැබෙන මුදල් සංරක්ෂණ, කැණීම්, නඩත්තු කටයුතු වලට යොදවා ගැනීමට හැකියාව ඇති බැවින් එම කටයුතු සිදු කරන ලදී. | මධ්‍යම සංස්කෘතික අරමුදල මඟින් වෙන් කළ මුදල් එම වෙන් කළ කාර්යය සඳහා භාවිතා කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | බුද්ධශාසන, සංස්කෘතික සහ ආගමික කටයුතු අමාත්‍යාංශයේ අතිරේක ලේකම්ගේ 2020 පෙබරවාරි 24 දිනැති ලිපිය අනුව එකතුව රු.18,711,101 ක් වටිනා මධ්‍යම සංස්කෘතික අරමුදල් යොදාගෙන ක්‍රියාත්මක කළ යුතු ව්‍යාපෘති අමාත්‍යාංශ ලේකම්වරයා විසින් අනුමත කර තිබුණි. 2020 වර්ෂයේ එම ව්‍යාපෘති සඳහා භෞතික හා මූල්‍ය ඉලක්ක ඇතුළත් ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර ඉදිරිපත් කරන ලෙස දන්වා තිබුණද, මෙම ව්‍යාපෘති සඳහා ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර නොතිබුණි. | කොරෝනා වසංගත තත්ත්වය හේතුවෙන් කාර්යාල කටයුතු නිසි පරිදි ක්‍රියාත්මක නොවීම මත ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම අතපසුවී ඇත. මින් ඉදිරියේදී නිවැරදිව සකස් කරමි. | මෙම ව්‍යාපෘති සඳහා වන ක්‍රියාකාරී සැලසුම් නියමිත පරිදි සකස් කළ යුතු වීම. |
| (ඈ) | ඇමරිකානු අරමුදල් දායකත්වය යටතේ 2017 සිට 2022 කාල පරිච්ඡේදය තුළ ක්‍රියාත්මක කළ හැකි සේ රජගලතැන්න පුරාවිද්‍යා සංරක්ෂණ කාර්යයන් ආරම්භ කර තිබුණි. මෙම ව්‍යාපෘතිය සඳහා 2020 වර්ෂයේදී රු.මිලියන 5.257 ක මූල්‍ය දායකත්වයක් ලැබී තිබුණත්, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය හා පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව අතර සිදු කිරීමට තිබූ ගිවිසුම්ගත ක්‍රියාවලියේ පැවති ගැටළු සහගත තත්ත්වය හේතුවෙන් සමාලෝචිත වර්ෂය තුළ අදාළ ව්‍යාපෘති කාර්යයන් ඉටු කර නොතිබුණි. | කොරෝනා වසංගතය හේතුවෙන් හා රට වසා තැබීම හේතුවෙන් අපේක්ෂිත පරිදි ව්‍යාපෘති නිම කිරීමට නොහැකි විය. | 2022 වර්ෂයේ අවසන් කළ යුතුව පැවති මෙම ව්‍යාපෘති කටයුතු සැලසුම් කළ පරිදි ඉටු කළ යුතු වීම. |
| (ඉ) | කැළණිය රජමහ විහාරයේ බිතුසිතුවම් සහ මූර්ති සංරක්ෂණය සඳහා 2015 වර්ෂයේදී රාජ්‍ය සංස්ථාවක් මඟින් රු.1,500,000 ක මුදලක් ලබාදී තිබුණි. 2020 වර්ෂය වන විට වර්ෂ ගණනාවක් ගතවී තිබුණද, කාර්යයන් ඉටු කිරීමකින් තොරව තැන්පතු ලෙජරයේ ඉදිරියට ගෙනවිත් තිබූ එකතුව රු.1,494,434 ක ශේෂය 2020 දෙසැම්බර් 11 දින රජයේ ආදායමට බැර කර තිබුණි. | රසායනාගාර අංශය මඟින් පිළිතුරු කැඳවා ඇතත්, ලැබී නොමැති අතර, කැළණිය රජමහා විහාරයේ බිතුසිතුවම් හා මූර්ති සංරක්ෂණ කටයුතු වල යම් ප්‍රමාදයක් ඇති බව දැනුම් දෙමි. | බාහිර ආයතන මඟින් ලැබූ මුදල්, අදාළ මුදල ලබා දුන් කාර්යය සඳහාම භාවිතා කළ යුතු වීම. |

**2.4 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| නිරීක්ෂණය | | | |
|---|---|---|---|
| **නීති,රීති හා රෙගුලාසි වලට යොමුව** | **අනුකූල නොවීම** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
| **(අ)** 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ | | | |
| (i) 11 වගන්තිය | ප්‍රාදේශීය කාර්යාල 10 ක 2020 වර්ෂයේදී භාණ්ඩ සමීක්ෂණයක් සිදු කර එම වාර්තා විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | සමීක්ෂණයන් අවසන් කර වාර්තා කඩිනමින් ඉදිරිපත් කිරීමට කටයුතු කරමි. | මෙම චක්‍රලේඛය අනුව වාර්ෂික සමීක්ෂණ පවත්වා වාර්තා ඉදිරිපත් කළ යුතුය. |
| (ii) 13.2 වගන්තිය | කෝට්ටේ පුරාවිද්‍යා කෞතුකාගාර පරිශ්‍රය තුළ අබලන් වූ මෝටර් රථ 02 ක් සහ දෙපාර්තමේන්තු ප්‍රධාන කාර්යාල පරිශ්‍රය තුළ මෝටර් රථ 03 ක් සහ යතුරුපැදි 06 ක් චක්‍රලේඛය ප්‍රකාරව අපහරණය කිරීමකින් තොරව වර්ෂ ගණනාවක සිට දිරාපත් වෙමින් පැවතුණි. | මේ සඳහා විශේෂ කමිටුවක් පත් කර ඇති අතර, කඩිනමින් එම වාහන අපහරණය කිරීමට කටයුතු කරමි. | මෙම චක්‍රලේඛය අනුව පරිහරණය කළ නොහැකි මෝටර් රථ අපහරණය කළ යුතුය. |
| **(ආ)** 2020 පෙබරවාරි 28 දිනැති අංක 02/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ මාර්ගෝපදේශ අංක 04 | රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් “බී” ගිණුම් සැසඳුම් වාර්තාව සඳහා ණයගැති ලේඛන සහ ණයහිමි ලේඛන යාවත්කාලීනව පවත්වාගෙන ගොස් නොතිබුණි. | මෙම ලේඛන පවත්වාගෙන ගොස් ඇති බව සඳහන් කරමි. | මෙම චක්‍රලේඛය අනුව ණයගැති හා ණයහිමි ලේඛන පවත්වාගෙන යා යුතුය. |

**2.5 රජයේ නිලධාරින්ට අත්තිකාරම් ගිණුම් පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| දෙපාර්තමේන්තුවේ දැනට සේවයේ නොමැති මියගිය, විශ්‍රාම ගිය, සේවය හැර ගිය සහ වැඩ තහනම් කළ සේවකයින්ගෙන් 2020 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු මුළු හිඟ ණය ශේෂ එකතුව රු.5,289,100 ක් විය. එම වටිනාකමින් එකතුව රු.1,620,953 ක් වර්ෂ 05 කට වැඩි කාලයක සිට අයවිය යුතු ශේෂයන් වන අතර, එම ශේෂ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | මෙම මුදල් අයකර ගැනීමට කටයුතු කරමින් පවතී. | මෙම හිඟ ණය ශේෂ අයකර ගැනීමට ක්‍රියා කළ යුතුය. |

**2.6 බැංකු ගිණුම් මෙහෙයවීම**

බැංකු ගිණුම් මෙහෙයවීම සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂාවේදී අනාවරණය වූ අඩුපාඩු පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාල ජංගම ගිණුමේ 2020 දෙසැම්බර් 31 දිනට එකතුව රු.1,426,091 ක් වූ නිකුත් කළ නමුත්, ඉදිරිපත් නොකළ චෙක්පත් 144 ක් විය. නමුත් 2020 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල බැංකු ගිණුම් පිළිබඳ සටහන ප්‍රකාරව නිකුත් කළ නමුත් ඉදිරිපත් නොකළ චෙක්පත් පවතින බවට තොරතුරු සටහන් කර නොතිබුණි. | පෞද්ගලික ලිපිනයන් සොයාගත නොහැකි වූ බැවින් මෙම චෙක්පත් පොදු තැන්පත් ගිණුමට බැර කරන ලදී. පසුව මුදල් රෙගුලාසි පරිදි කටයුතු කර රජයේ ආදායමට බැර කරමි. | මෙම ඉදිරිපත් නොකළ චෙක්පත් පිළිබඳව විස්තර අදාළ සටහන තුළ සඳහන් කළ යුතුව තිබුණි. |

## 2.7 තැන්පතු ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2014 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා කාලය තුළ ව්‍යාපෘති 92 ක කටයුතු වෙනුවෙන් ලැබුණු ප්‍රතිපාදන වලින් 2020 දෙසැම්බර් 31 දිනට ඉතිරි වූ ප්‍රතිපාදන එකතුව රු.27,260,458 ක් නිරවුල් කර නොතිබුණි. | ප්‍රාදේශීය සහකාර අධ්‍යක්ෂකවරුන්ගෙන් තොරතුරු ඉල්ලා ඇති අතර, තවදුරටත් ක්‍රියාත්මක නොවන ව්‍යාපෘති සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කරමි. | තොරතුරු ලබාගෙන ක්‍රියාත්මක නොවන ව්‍යාපෘති සම්බන්ධව මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) | පුරාවිද්‍යා ස්ථාන කැණීම්, සංරක්ෂණය, අළුත්වැඩියා ව්‍යාපෘති 14 ක් වෙනුවෙන් රජයේ දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන, පෞද්ගලික ආයතන, විදේශීය ආයතන වලින් ප්‍රධාන වශයෙන් 2014 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා කාලයේදී ලැබුණු අරමුදල් වලින් 2020 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘති කටයුතු ක්‍රියාත්මක කර ඉතිරි මුදල් ශේෂ එකතුව රු.14,463,670 ක් නිරවුල් කර නොමැතිව තැන්පතු ගිණුමේ රඳවාගෙන තිබුණි. | තොරතුරු ඉල්ලා ඇති අතර, ලැබුණු පසු මුදල් රෙගුලාසි ප්‍රකාරව රජයේ ආදායමට බැර කරමි. | පිළිතුර ප්‍රකාරව ක්‍රියා කිරීම සුදුසු වේ. |
| (ඇ) | පුරාවිද්‍යාත්මක ස්ථාන වල ඉදිකිරීම් හා නඩත්තු කොන්ත්‍රාත් 17 ක ගෙවීම් වලින් 2020 දෙසැම්බර් 31 දිනට රඳවාගත් මුදල් රු.2,194,747 ක් නිරවුල් කිරීමට කටයුතු නොකර තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබුණි. | තොරතුරු ඉල්ලා ඇති අතර, ලැබුණු පසු මුදල් රෙගුලාසි ප්‍රකාරව රජයේ ආදායමට බැර කරමි. | පිළිතුර ප්‍රකාරව ක්‍රියා කිරීම සුදුසු වේ. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යභාරයන් ඉටු නොකිරීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) දෙපාර්තමේන්තුවේ බස්නාහිර පළාත් කාර්යාලය යටතේ ඇති පාහියංගල ගල්ලෙන ආශ්‍රිත සංරක්ෂණ සහ කැණීම් කටයුතු 2012 වර්ෂයෙන් පසුව වසර 09 ක පමණ කාලයක් නතර කර දමා තිබුණි. විගණන අංශය සිදු කළ ක්ෂේත්‍ර පරීක්ෂාවන් අනුව අක්කර 40 පමණ භූමි ප්‍රදේශයක් අයත් මෙම ගල්ලෙන අවට මැනීම් කටයුතු සිදු කර මායිම් කණු සිටුවා නොතිබූ අතර, මෙම ගල්ලෙන සම්බන්ධව ගවේෂණය කර ගවේෂණ වාර්තාවක්ද නිකුත් කර නොතිබුණි. | 2021 වර්ෂයේ ඇස්තමේන්තු මාසයට පෙර මෙම සංවර්ධන කටයුතු සම්පූර්ණ කිරීමට සැලසුම් කර ඇත. | පිළිතුර ප්‍රකාරව කාර්යය සම්පූර්ණ කිරීමත්, මැනීම් කටයුතු සිදු කර මායිම් කණු සිටුවීමත් ගවේෂණ වාර්තා නිකුත් කිරීමත් සිදු කළ යුතුව පවතී. |
| (ආ) පොදු තැන්පත් සහ බාහිර ආයතන ආධාර යටතේ 2020 වර්ෂයේදී දෙපාර්තමේන්තුවේ සියළුම අංශ මඟින් ව්‍යාපෘති 28 ක් ක්‍රියාත්මක කර තිබුණි. එම ව්‍යාපෘති 28 න් ගවේෂණ හා ලේඛනගත කිරීම් අංශයත්, වාස්තු විද්‍යා සංරක්ෂණ අංශයත් විසින් ක්‍රියාත්මක කළ ව්‍යාපෘති 02 ත් හැර ඉතිරි ව්‍යාපෘති 26 ම භෞතික ප්‍රගතිය සියයට 50 කට වඩා අඩු මට්ටමක පැවතුණි. | රටේ පැවති කොරෝනා රෝග ව්‍යාප්තිය සහ නිරෝධායන නීති රීති හා සංචරණ සීමාවන් තුළ අපේක්ෂිත පරිදි ව්‍යාපෘති නිම කිරීමට නොහැකි විය. | 2020 දී රට තුළ කොරෝනා රෝගය ව්‍යාප්ත වුවද, ප්‍රාදේශීයව බොහෝමයක් වැඩබිම් පැවතීම නිසාත්, 2020 වර්ෂය තුළ ළඟාකරගත් ප්‍රගතියට වැඩි ප්‍රගතියක් ලබා ගැනීමට කටයුතු කල යුතු වීම. |

**3.2 ප්‍රධාන කාර්යයන්ට පටහැනි ක්‍රියාකාරකම්**

| විගණන නිරීක්ෂණය | ගණනන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| පුරාවිද්‍යා ස්ථාන සහ ස්මාරක සංරක්ෂණය හා ආරක්ෂා කිරීම සඳහා පිහිටුවා තිබූ පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව විසින් මාර්ග නඩත්තු කටයුත්තක් සඳහා පිටකෝට්ටේ හංදියේ ස්ථාපනය කර තිබූ ජුබිලි කණුව 2020 වර්ෂයේදී ගළවා ඉවත් කර තිබුණි. ක්‍රි.ව. 1887 වර්ෂයේ දී ස්ථාපනය කරන ලද මෙම ස්මාරකය පිටකෝට්ටේ කෞතුකාගාරයේ ලේඛනගත කිරීමකින්ද තොරව තැන්පත් කර තිබූ අතර, මාර්ග නඩත්තු කටයුතු අවසන් වුවද, එම ස්මාරකය නැවත ස්ථාපනය කිරීමට පියවරගෙන නොතිබුණි. | මෙම ජුබිලි කණුව තාවකාලිකව මාර්ග සංවර්ධන කටයුතු සඳහා ඉවත් කළ අතර, මාර්ග සංවර්ධන කටයුතු අවසන් බව මෙතෙක් දන්වා නොමැත. කෙසේ නමුත් ස්ථිරවම මෙය නැවත ජුබිලි කණුව මංසන්ධියේ ස්ථාපනය කිරීමට කටයුතු කරමි. | පිළිතුර ප්‍රකාරව යළි ස්ථාපනය කිරීමට ක්‍රියා කළ යුතු වීම. |

**3.3 දේශීය අරමුදල්වලින් ක්‍රියාත්මක කළ ව්‍යාපෘති**

| විගණන නිරීක්ෂණය | ගණනන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ඓතිහාසික කෝට්ටේ රාජධානියට අයත් කොටු පවුර පාදා මතු කර ගැනීම, කැණීම් කටයුතු සිදු කිරීම, දිය අගල් ප්‍රදර්ශන මට්ටමට පත්කිරීම යනාදිය කොටු බැම්ම සංරක්ෂණය කිරීමේ අරමුණු විය. අනවසර ඉදිකිරීම්, පස් සහ ගස්වැල් වලින් ප්‍රකාර බැම්ම වැසී ගොස් තිබූ අතර, වර්තමානය වන විට බැම්මෙන් මීටර් 2000 පමණ සංරක්ෂණය කර තිබුණි. බැම්ම සංරක්ෂණය සඳහා 2020 වර්ෂයේදී ජාතික ප්‍රතිපත්ති හා ආගමික කටයුතු අමාත්‍යාංශය මඟින් රු.9,500,000 ක් වෙන් කර දී තිබුණද, දෙසැම්බර් 31 දිනට එකතුව රු.2,065,585 ක් වැය වීම නිසා එහි මූල්‍ය හා භෞතික ප්‍රගතිය පිළිවෙලින් සියයට 22 ක් සහ සියයට 55 ක් විය. | මෙහිදී දැඩි සංරක්ෂණ බාධාවන්ට මුහුණු දීමට සිදු විය. මෙම බැම්ම කැණීම් කර මතු කර ගෙන සංරක්ෂණය කළ යුතුය. මේ සඳහා කබොක් ගල් සොයා ගැනීමද අපහසු විය. 2018 හා 2020 වර්ෂවල කාර්යය සාධනය උපරිම මට්ටමකට ලඟා කරගත නොහැකිවීම යන්න “ග්‍රාම වියදම් පොත” අනුවද සත්‍යයකි. ඉදිරියේදී මෙම තත්වයන් මඟ හරවා ගැනීමට කටයුතු කරමි. | පිළිතුර ප්‍රකාරව කටයුතු කිරීම යෝග්‍ය වේ. |

## 3.4 වත්කම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| දෙපාර්තමේන්තුවේ ප්‍රාදේශීය මට්ටමේ කාර්ය භාරය ඉටු කිරීම සඳහා කලාප කාර්යාල පිහිටුවා තිබුණි. එම කලාප කාර්යාල බොහෝමයක් බෞද්ධ විහාරස්ථානයක හෝ පොදු ගොඩනැගිල්ලක ඉතා අවම කාර්යාල පහසුකම් මධ්‍යයේ පවත්වාගෙන යනු ලබන බව නිරීක්ෂණය විය. එම කාර්යාල වල සේවයේ නියුතු නිලධාරීන්ට ප්‍රමාණවත් ඉඩකඩ හා අවම කාර්යාල පහසුකම් නොතිබූ ස්ථාන හඳුනාගෙන අවශ්‍ය පහසුකම් ලබාදීමට ඉහළ කළමනාකරණය පියවරගෙන නොතිබුණි. | මෙම කාර්යාලවල යටිතල පහසුකම් අවම මට්ටමක පවතී. විහාරස්ථානවල ඇති ඇතැම් කාර්යාල වෙනත් ස්ථානයකට ගෙන යාමේ අවශ්‍යතාවයක්ද පවතී. මෙම කාර්යාල සඳහා අවශ්‍ය පහසුකම් සැපයීමට කටයුතු කරමි. | දෙපාර්තමේන්තුවේ ප්‍රාදේශීය කාර්යාල සහ කලාප කාර්යාලය සඳහා අවශ්‍ය කාර්යාල පහසුකම් ලබා දීමට ක්‍රියා කළ යුතුය. |

## 3.5 කළමනාකරණ දුර්වලතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) ජාතික වැදගත්කමක් සහිත ඉඩම් පුරාවිද්‍යා රක්ෂිත ලෙස ප්‍රකාශයට පත් කිරීමත්, එහි ආරක්ෂාව තහවුරු කර ගැනීම සඳහා විධිමත් වැඩපිළිවෙලක් යෙදීමත් දෙපාර්තමේන්තුව සතු වැදගත් කාර්යයභාරයක් විය. විගණන අංශය කළ පරීක්ෂා කිරීම් අනුව පසුගිය වර්ෂ 20 ක පමණ කාලය තුළ එවැනි ජාතික වැදගත්කමක් ඇති ඉඩම් 11 ක් පමණක් රක්ෂිත වශයෙන් ප්‍රකාශයට පත් කර තිබුණි. | තහනම් ඉඩම් ප්‍රකාශයට පත් කිරීමේ වැඩපිළිවෙල ක්‍රියාත්මකව පවතින අතර, පසුගිය වසර 20 ක කාලය තුළ තහනම් ඉඩම් 11 ක් රක්ෂිත වශයෙන් ප්‍රකාශයට පත් කර ඇත. | පනතේ ප්‍රතිපාදන වලට අනුකූලව ජාතික වැදගත්කමක් ඇති ඉඩම් පුරාවිද්‍යා රක්ෂිත ලෙස ගැසට් කිරීමේ කාර්යය කඩිනමින් කළ යුතුවීම. |

| | | | |
|---|---|---|---|
| (ආ) | යාන් ඔය ජලාශ ව්‍යාපෘතිය සඳහා එම ජලාශයට යටවන භූමිය තුළ තිබූ පුරාවස්තු කැණීම් කර ඉවත් කර තිබූ අතර, ඒ පිළිබඳව සකස් කළ හානි ඇගයුම් වාර්තාවට අනුව එම පුරාවස්තු ආරක්ෂිතව තැන්පත් කිරීම සඳහා කෞතුකාගාරයක් ඉදිකිරීමට යෝජනා කර ඒ සඳහා වන මූලික සැලසුම් හා ඇස්තමේන්තු ඉදිරිපත් කරන ලෙස පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව වෙත දැනුම් දී තිබුණි. මෙම කෞතුකාගාරය ඉදිකිරීමට අදාළ මූලික සැලසුම් හා ඇස්තමේන්තු සකස් නොකිරීම නිසා එම පුරාවස්තු අනාරක්ෂිත ලෙස පදවිය පුරාවිද්‍යා කලාප කාර්යාලය තුළ ගබඩා කර තිබුණි. | 2012 ඉදිරිපත් කළ සමීක්ෂණ වාර්තාවක යාන් ඔය ව්‍යාපෘතියෙන් හමුවන පුරාවස්තු කෞතුකාගාරයක තැන්පත් කළ යුතු බව සඳහන් කර ඇත. කැණීම් කර හමුවූ පුරාවස්තු අනුරාධපුර විශ්ලේෂණ ශාඛාවේ සහ පදවිය පුරාවිද්‍යා ස්ථානයේ ඇත. කෞතුකාගාර ගොඩනැගිල්ලක් ඉදිකිරීමට සැලසුම් සකස් කර වාරිමාර්ග දෙපාර්තමේන්තුවට භාරදුන් අතර, එම ගොඩනැගිල්ල ඉදිකළ පසුව පුරාවස්තු එහි ස්ථාපිත කිරීමට අවශ්‍ය ඉදිරි කටයුතු සිදු කරන බව දන්වමි. | මෙම කෞතුකාගාරය ඉදිකිරීමේ අවශ්‍යතාවය හා හැකියාව සොයා බලා ඒ අනුව ක්‍රියා කළ යුතු වේ. |
| (ඇ) | දෙපාර්තමේන්තුව සතු චංචල පුරාවස්තු වන පෞරාණික කාසි විශාල ප්‍රමාණයක් ලේඛනගත කිරීමකින් තොරව අභිලේඛන, නානක විද්‍යා අංශයේ රසායනාගාර අංශය තුළ සහ කලාප කාර්යාලවල ලේඛනගත කිරීමකින් තොරව පවතින බව නිරීක්ෂණය විය. | මෙම කාසි පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවට වසර ගණනාවක් තිස්සේ භාරදෙන ලද ඒවා වේ. ඒවා ඉදිරියේදී විධිමත්ව සංරක්ෂණය කර ලේඛනගත කිරීමට යෝජිතය. කළාප කාර්යාලවල ඇති කාසි ලේඛනගත කිරීමටද ඉදිරියේදී කටයුතු කරමි. | චංචල පුරාවස්තු හා කාසි කඩිනමින් ලේඛනගත කළ යුතු විය. |
| (ඈ) | දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලය පිහිටි ප්‍රධාන ගොඩනැගිල්ලේ බිම් මහල ඵලදායී කාර්යයකට භාවිතා නොකර වසර ගණනාවක් තිස්සේ නිශ්කාර්යාව පැවතුණි. | බිම් මහලේ බිත්ති සහ පොළවෙන් සිදුවන ජල කාන්දුව මත මෙය නිශ්කාර්යාව ඇත. මෙය 2022 වසරේදී භාවිතයට සුදුසු අයුරින් සකස් කිරීමට යෝජිත වේ. | දෙපාර්තමේන්තුවේ බිම් මහල ඵලදායී කාර්යයකට භාවිතා කිරීම අවශ්‍ය වේ. |

**4.** **මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | ගණකාධිකාරී අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2020 දෙසැම්බර් 31 දිනට දෙපාර්තමේන්තුවේ තනතුරු 84 කට අදාළව අනුමත කාර්ය මණ්ඩලය 4356 ක්ද, තත්‍ය කාර්ය මණ්ඩලය 1879 ක්ද විය. මේ අනුව පුරප්පාඩු සංඛ්‍යාව 2477 ක් විය. මෙම පුරප්පාඩු අතරින් විධායක මට්ටමේ පුරප්පාඩු 39 ක් පැවති අතර, ඒ සඳහා වැඩ ආවරණ මට්ටමින් පත්කර තිබුණි. මෙම පුරප්පාඩු සඳහා බඳවා ගැනීමට විවිධ බාධාවන් ඇති වී තිබූ අතර, සේවක පුරප්පාඩු පැවතීම නිසා අපේක්ෂිත කාර්ය භාරය ඉටු කර ගැනීමේ බාධාවක් විය හැකි බව නිරීක්ෂණය විය. | නව තනතුරු 1940 ක් අනුමත වීම තනතුරුවල පුරප්පාඩු විශාල සංඛ්‍යාවක් ඇතිවීමට හේතු වී ඇත. මෙම තනතුරු පිරවීමට විවිධ බාධාවන් ඇති වී ඇති අතර, මෙම පුරප්පාඩු පිරවීමට අදාළ ක්‍රියාමාර්ග ගනිමින් පවතී. | බඳවා ගැනීම් පරිපාටිය හා පවත්නා නීති රීති අනුව මෙම සේවක පුරප්පාඩු අවශ්‍යතාව මත පදනම්ව කඩිනමින් සම්පූර්ණ කිරීමට ක්‍රියා කළ යුතුය. |